WARNALEGAL
Justice for all

www.warnalegal.com




- FAMILY LAW
- MIGRATION LAW
- CONVEYANCING
- LITIGATION
- AUSTRALIAN LEGAL ADVICE
- SRI LANKAN LEGAL ADVICE
- COMMERCIAL & BUSINESS LAW
- POWERS OF ATTORNEY & WILLS
- ENGLISH/SINHALESE TRANSLATION & INTERPRETING SERVICE
- SRI LANKAN DEEDS & COMPANY REGISTRATION SERVICE

GUSS DESIGN 03 9769 0099



Madhu Warnakulasuriya LL.B
Solicitor and Barrister
Registered Migration Agent
(MARN 1068979)
Attorney at Law in Sri Lanka



Need Legal Help? Call us Now
03 9792 9977

Australia:
1/44 King Street
Dandenong VIC 3175
0432 480 133
+61 3 9792 9977
+61 3 9701 3718
info@warnalegal.com
warnalegal1

Sri Lanka:
01 Angampitiya Waikkala Sri Lanka
Hotline – 0776 120 008
031 22 72223 031 22 72223
warnalegal2@gmail.com
warnalegal2




# නියම දක්ෂයා

මහා තරග ගණනාවකින් ජය ගත්ත තරුණ ආඩම්බරකාර දුනුවායෙක් සෙන් ආචායවරයා හමුවෙන්න ආවා ආචාර්යවරයා ප්‍රසිද්ධව හිටියෙ අති දක්ෂ දුනුවායෙක් හැටියට.

"ඔහේ මහාලොකු දුනුහිල්ප ආචාරයවරයෙක් කියනවනෙ... මේ බලන්න මගේ වැඩ" ආඩම්බරකාර තරුණයා කිව්වා.

ඔහු දුනුදිය මතට ඊතලයක් තියලා ඉතා ඈත ඉලක්කයකට හරියටම විද්දා. ඊළඟට තවත් ඊතලයක් අරගෙන අර කලින් විද්ද ඊතලය දෙබෑවී යන විදිහට විද්දා.

"දැක්කද?" තරුණයා ආඩම්බරෙන් අහනවා.

ආචාර්ය තුමා සද්ද නැති- බලා ඉන්නවා.

"පුලුවන්ද ඒ හපන්කම කරල පෙන්නන්න?" තරුණයා ආයෙමත් උජ-ාරුවෙන් අහනවා.

ආචාර්යවරයා කිසිවක් කියන්නෙ නැතිව දුන්නත් කරේ දාගෙන කන්ද නගින්න පටන් ගත්තා. තරුණයත් ආචිර්යවරයා මේ කරන්න යන්නෙ මොකක්ද බලන්න ඔහු පසුපසින් ගියා.

ආචාර්යවරයා කන්දේ තැනක මහා පාතාලයක් හරහා ලී කොටයක් දමා තිබූ ඒදණ්ඩක් ළඟ නැවතුණා. ඉතා සීරුවන් ඒදණ්ඩ මත හිටගත්තා.

ඒ වැනෙන ඒ දණ්ඩ මත සිටගෙන කිසිම අපහසුවක් නැතිව ඉතා ඈත ඉලක්කයකට නිවැරදිව ඊතලය විද්දා.

"ඕකත් වැඩක්ද?" තරුණයා කිව්වා.

ඔහු ඒදණ්ඩට ගොඩවන්න පය තිබ්බා. ඒදණ්ඩ නලදතක් වගේ සෙළවෙනවා.
පහළ පතුළක් නොපෙනන පාතාලය.

තරුණයා ඒදණ්ඩට ගොඩවෙලා සමබරව ඉන්න උත්සාහ කළා.
ඒත් වැනෙන සුළු ඒදණ්ඩ මත සමබරව ඉන්න ඔහුට නොහැකි වුණා.
ඔහු අසරණව ආචාර්යවරයා දෙස බලා හිටියා.

"ඔබට දැන් වැටහෙනවද? දක්ෂකම විතරක් තිබ්බට මදි කියන එක" ආචාර්යවරයා සන්සුන්ව ඇහුවා

****************

**ඒක තමයි ඇත්ත**

**නියම දක්ෂයා කියන්නෙ දක්ෂකමත් එක්කම මානසික ඒකාග්‍රතාවත් සමබරව පවත්වාගන්නා පුද්ගලයායි**